# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

DMC

## 01. අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) - HM 1-1

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම සමග පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විද්‍යාපති/ ශාස්ත්‍රපති උපාධිය සහ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

## 02. අධ්‍යක්ෂ (මුදල්) - HM 1-1

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, වාණිජ්‍යය, ව්‍යාපාර මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සමග.

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාපති/ ශාස්ත්‍රපති උපාධිය හෝ ශ්‍රී ලංකා / එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකරණ ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකරණ ආයතනයේ හෝ වරලත් ගණකාධිකාරී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ (MM 1-1) පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

## 03. පුද්ගලික සහකාර - JM 1-1

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම සහ ලේකම් වෘත්තීය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම සමග පුද්ගලික සහකාර තනතුරේ වසර 06 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

## 04. පුස්තකාලයාධිපති - MA 3

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව විෂයයක් සහිතව ලබාගත් උපාධියක් හෝ

පුස්තකාල විද්‍යාව පිළිබඳ N.V.Q. 05 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් සහිත ඩිප්ලෝමාවක් සමග වසර 05 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 05. කළමනාකරණ සහකාර (තාක්ෂණික) MA 2-1

| | | | |
|---|---|---|---|
| (1) | තොරතුරු තාක්ෂණ සහකාර | (2) | සන්නිවේදන කාර්මික ශිල්පී |
| (3) | ගුවන් විදුලි ක්‍රියාකරු | (4) | චලන හා නිශ්චල කැමරා ශිල්පී |

ඉහත එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් එක් එක් තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

## 06. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) - MA 1-1

සිංහල / දෙමළ, ගණිතය ඇතුළුව තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

මෙම පුවත්පත් දැන්වීමේ අංක 06 හා 07 යටතේ සඳහන් වන තනතුරුවලට පැවරෙන රාජකාරී අනුව එකී තනතුරුවලට තෝරාගනු ලබන්නේ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ රාත්‍රී කාලයේ හා සේවා මුර ක්‍රමයට හෝ පැය 24x7 සේවය කිරීටම සිදු වන බැවින් එම හැකියාව ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

| වැටුප් ක්‍රමය | වයස අවුරුදු |
|---|---|
| HM 1-1- 2006 : - රු. 38,530 - 15x1,100-55,030<br>HM 1-1- 2016 : - රු. 81,670-15x2 270-115,720.00 | 35 ට නොඅඩු හා 50 ට නොවැඩි |
| JM 1-1- 2006 A : - රු. 20,525 - 10x365 - 18x550-34,075<br>JM 1-1- 2016 : - රු. 42,600-10x755-18x1135-70,580 | 22 ට නොඅඩු හා 45 ට නොවැඩි |
| MA3-2006 A : - රු. 15,600-10x215-4x240-15x320-7x360-26,030<br>MA 3 - 2016 : - රු. 32,200-10x445-11x660-10x730-5x750-54,960 | 22 ට නොඅඩු හා 45 ට නොවැඩි |
| MA 2-1 - 2006 A: - රු. 14,610-10x145-7x170-4x240-20x320-24,610<br>MA 2-1 - 2016 : - රු. 30,310-10x300-7x350-4x495-20x660-50,940 | 18 ට නොඅඩු හා 45 ට නොවැඩි |
| MA 1-1 - 2006 A : - රු. 13,450-10x145-7x170-4x240-20x320-23,450<br>MA 1-1 - 2016 : - රු. 27,910-10x300-7x350-4x495-20x660-48,540 | 18 ට නොඅඩු හා 45 ට නොවැඩි |

(කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2016 ට අනුව නව වැටුප් ක්‍රමයන් ක්‍රියාත්මක වීම 2020 වර්ෂයේ සිට සිදු වේ)

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

**පත්වීම් ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ www.dmc.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ගන්නා ලද අයදුම්පත් 2016.10.10 දින හෝ ඊට පෙර **"අධ්‍යක්ෂ ජනරාල්, ආපද කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යා මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ඉල්ලුම් කරන තනතුර"** පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පත ආදියෙහි පිටපත් තමා විසින්ම සත්‍ය පිටපත් බවට සහතික කොට එවිය යුතු වේ. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම මධ්‍යස්ථානය වගකියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවන් සිය අයදුම්පත්‍රය ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතු අතර, එසේ නොවන සහ අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් -**

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිල්මත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය අදාළ තනතුරෙන් පහ කිරීමට පිළිවන.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**